## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය - 2016

-----------------------------------------------------

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන, මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 237 හා මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.6,468,061 ක් වටිනා කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම්, පරිගණක උපකරණ, පුස්තකාල පොත් හා ලිපි ද්‍රව්‍යවලට අදාළ ගෙවීම් වවුචරවල භාණ්ඩ ලැබී ඇති බවටද, ස්ථාවර වත්කම් ලේඛනය, බඩු ලේඛන පොත් හා පරිග්‍රහණ ලේඛනය යනාදියේ එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවටද සහතිකයක් ඇතුළත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.30,740,552 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,902,742 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.28,837,810 ක වර්ධනයක් දක්නට ලැබුණි. ධාරිතා වර්ධන ව්‍යාපෘතියක් සඳහා රු.42,360,676 ක් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබීම, මූල්‍ය ප්‍රතිඵලයේ ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.5,340,626 ක් වූ ඌනතාවය උච්ඡාවචනයන් සහිතව 2016 වර්ෂය වන විට රු.30,740,552 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ දායකත්වය රු.4,139,605 ක සෘණ අගයක් ගෙන තිබුණද ඉන් පසු වර්ෂවලදී ධන අගයක් ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එය රු.40,272,542 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතන පනත ප්‍රකාරව අධිකරණ නිලධාරීන්ගේ වෘත්තිය ප්‍රවීනත්වය වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ දැනුම වර්ධනය සඳහා රැස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම ආයතනයේ ප්‍රධාන පරමාර්ථය වී තිබුණි.

ඉහත අරමුණු ඉටුකරගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අධිකරණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 58 ක් හා වැඩමුළු 08 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද කාර්යසාධන වාර්තාව අනුව පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 21 ක් හා වැඩමුළු සංඛ්‍යාව 03 ක් වී තිබුණු බැවින් අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2016 වර්ෂයේ අයවැය යෝජනාවක් වූ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ධාරිතා වර්ධනය සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 110 න් ආයතනය වෙත රු.63,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන ප්‍රධාන ක්‍රියාකාරකම් 4 ක් යටතේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. ඉන් එක් ක්‍රියාකාරකමක් වූ පරිගණක මිලදී ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන රු.40,000,000 කින් සියයට 99.74 ක් වැයකර පරිගණක මිලදී ගෙන තිබුණි. නමුත් තවත් ක්‍රියාකාරකම් දෙකක් වූ විනිසුරුවරුන් සඳහා විදේශ ශිෂ්‍යත්ව ලබාදීම හා කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන පිළිවෙලින් රු.12,000,000 ක් සහ රු.1,000,000 ක් සම්පූර්ණයෙන්මද, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ජාල ප්‍රතිශ්ඨාපනය (Establishing SLJI Net) සඳහා සලසා තිබුණු රු.10,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.7,538,128 ක් හෙවත් සියයට 75.4 ක ප්‍රතිපාදනද ඉතිරිවී තිබුණු බැවින් අයවැය යෝජනා නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 ආර්ථික නොවූ ගනුදෙනු**

-------------------------

පර්යේෂණ නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා පලකරන ලද පුවත්පත් දැන්වීම දෝෂ සහිතව පලකර තිබීම හේතුවෙන් එම දැන්වීම නැවත පළ කිරීමට සිදුවී තිබුණු අතර දෝෂ සහිත දැන්වීම පල කිරීම සඳහා දරා තිබුණු රු.225,112 ක මුදල අනාර්ථික වියදමක් විය.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

-------------------------------

ආයතනය විසින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ වර්ෂය පුරා අවම ශේෂය ලෙස රු.2,172,403 ක් ඌන උපයෝජිතව පැවතුණු අතර එය 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තියේ විධිවිධාන අනුගමනය කරමින් කෙටි කාලීන ආයෝජන මාර්ගවල යොදවා ගැනීම පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

**4.4 කාර්යමණ්ඩල කළමනාකරණය**

---------------------------------

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාවේ පවතින තනතුරු 03 ක් 2017 ජුනි 01 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

**5.1 අභ්‍යන්තර විගණනය**

---------------------

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන වැඩසටහනෙහි විනිසුරුවරයන්ගේ ආයතනය විගණනයට මිනිස් දින 50 ක කාලයක් වෙන්කර තිබුණි. නමුත් අභ්‍යන්තර විගණන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණු බැවින් අභ්‍යන්තර විගණනයක් සිදුකළ බව තහවුරු කර ගත නොහැකි විය.

**5.2** **අයවැය පාලනය**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය අනුව සෑම මුදල් වර්ෂයක් සඳහාම අයවැය ලේඛනයක් පිළියෙල කර අදාළ මුදල් වර්ෂය ආරම්භවීමට මාස තුනකට පෙර ආයතනයේ පාලක මණ්ඩලයෙන් අනුමත කරවාගෙන එහි පිටපතක් අදාළ වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය පාලක මණ්ඩලයෙන් අනුමත කරවාගෙන එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 17 ක අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 28 සිට සියයට 1068 දක්වා විචලනයන් පැවතීමත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන අනුමතව නොතිබුණු වියදම් සඳහා රු.4,228,697 ක් වැය කර තිබීමත් හා යන්ත්‍ර සූත්‍ර හා විදුලි උපකරණ ලබාගැනීම සඳහා අනුමත ප්‍රතිපාදනය රු.1,500,000 ක් උපයෝජනය කර නොතිබීමත් හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.